සියලුම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

# 84 - හින්දි

## ලකුණු දීමේ පටිපාටිය

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2018

## 84 - හින්දි

## ලකුණු බෙදීයාම

I පත්‍රය - 100 (50 × 2)

II පත්‍රය - 100

පළමු වන ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න 50කින් සමන්විත ය. එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් ලකුණු 100යකි.

දෙවන ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත ය. එහි ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 7කි. පළමුවන කොටසේ ප්‍රශ්න තුන ම අනිවාර්ය වේ. දෙවන හා තෙවන කොටස්වල ප්‍රශ්න දෙක බැගින් වේ. ඒ එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් තෝරා ගත යුතු ය. පිළිතුරු ලිවිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

I කොටස - 70 (35 + 20 + 15)

II කොටස - 15

III කොටස - 15

එකතුව - 100

අවසාන ලකුණ - 200 ÷ 2 = 100

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.

   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) .................................................. √ △ $\frac{4}{5}$

(ii) .................................................. √ △ $\frac{3}{5}$

(iii) .................................................. √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද ලියන්න. අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

- **सभी प्रश्नों के उत्तर दीजिए। निम्नलिखित वाक्यों के रिक्त स्थानों की पूर्ति के लिए योग्य सही उत्तर चुनकर उसकी संख्या दिये गये कोष्ठक में लिखिए।**

01. मानक हिंदी, दिल्ली के आस-पास की भाषा .............. पर आधारित है।
(1) ब्रज (2) भोजपुरी (3) खड़ीबोली (4) अवधी (5) पूर्वी (......)

02. मौखिक हिंदी में -य के पूर्व -ऐ स्वर का उच्चारण .............. होता है।
(1) ऐ (2) अइ (3) अउ (4) आइ (5) आउ (......)

03. हिंदी में -ह व्यंजन के पूर्व -अ स्वर के परिवर्तन के लिए .............. शब्द एक उदाहरण है।
(1) पहेली (2) पहुँचना (3) पहाड़ (4) पाहुना (5) पहला (......)

04. त् + र के संयुक्त व्यंजन का मानक रूप .............. होता है।
(1) त्र (2) त्‍र (3) तृ (4) व्र (5) त्र (......)

05. .............. इत्यादि बिना खड़ीपाई व्यंजन कहलाते हैं।
(1) ल, त, द (2) ल, र, द (3) ड, ट, क (4) ड, ट, ह (5) ट, र, ल (......)

06. सामान्यत: .............. व्यंजन शब्दों के अंत में आते हैं।
(1) ड़, ढ (2) ड़, ढ़ (3) ड, ढ (4) ड, ढ़ (5) ड, ड़ (......)

07. **अर्धानुनासिक** और **अनुनासिक** का सही प्रयोग सहित शब्द युग्म क्रमश: .............. है।
(1) साँस, संत (2) संत, साँस (3) साँस, बेंत (4) बेंत, साँस (5) संत, बेंत (......)

08. शुद्ध और मानक वर्तनी में लिखित सही शब्द पंक्ति .............. है।
(1) कुम्हार, श्रंखला, पश्चिम (2) कुम्हार, शृंखला, पश्चिम
(3) कुंहार, शृंखला, पश्चिम (4) कुम्हार, श्रंखला, पश्चिम
(5) कुम्हार, शृंखला, पश्चिम (......)

09. **गुरु, भैंसा, श्रीमान** इन शब्दों के स्त्रीवाचक शब्द क्रमश: .............. हैं।
(1) गुरु, भैंसी, श्रीमानी (2) गुरुआइन, भैंस, श्रीमती
(3) गुरुआइन, भैंसा, श्रीमती (4) गुरुआइनी, भैंस, श्रीमती
(5) गुरुआइन, भैंसी, श्रीमती (......)

10. **भगवती, लुहारिन, वधू** इन शब्दों के पुरुषवाचक शब्द क्रमशः ............. हैं।
(1) भगवता, लुहार, वर (2) भगवान, लुहारा, वर
(3) भगवता, लुहारा, वार (4) भगवान, लुहार, वर
(5) भगवान, लुहार, वार (......)

11. **घड़ी, रात, पोता, भालू** इन शब्दों के बहुवचन शब्द क्रमशः ............. हैं।
(1) घड़ियाँ, रात, पोता, भालू (2) घड़ीयाँ, राते, पोते, भालू
(3) घड़ियाँ, रातें, पोते, भालू (4) घड़ीयाँ, रातें, पोता, भालू
(5) घड़ियाँ, रातें, पोतें, भालुएँ (......)

12. **कान, गायें, वस्तुएँ, लोटे** इन शब्दों के एकवचन शब्द क्रमशः ............. हैं।
(1) कान, गाया, वस्तु, लोटा (2) कान, गाय, वस्तु, लोटा
(3) काना, गाय, वस्तु, लोटा (4) कान, गाय, वस्तू, लोटा
(5) कान, गाया, वस्तू, लोटी (......)

13. इतनी महँगी ज़मीन खरीदने के लिए धन ............. से मिल जाएगा?
(1) कैसे (2) कितना (3) कहाँ (4) क्यों (5) कौन (......)

14. हमें तनिक भी पता नहीं कि यह घटना ............. हुई थी।
(1) कब (2) किसके (3) कैसा (4) कितना (5) कौन (......)

15. बड़ी बहन का कमरा घर ............. मंज़िल में है।
(1) के दूसरा (2) के दूसरे (3) का दूसरा (4) की दूसरे (5) की दूसरी (......)

16. ............. दिनों में गाँव का जीवन बहुत सरल और सादा था।
(1) वे (2) ये (3) उन (4) इस (5) यह (......)

17. ............. वस्त्रों को उतार दो, वरना तुम्हें सर्दी लगेगी।
(1) वे गीले (2) वह गीले (3) उन गीली (4) उन गीले (5) उस गीले (......)

18. बापरे, गर्मी के कारण यह तस्वीर ............. हो गयी है?
(1) कितनी धुँधली (2) कितना धुँधली (3) कितने धुँधला
(4) कितना धुँधला (5) कितने धुँधले (......)

19. आप चिंता मत कीजिए। ............. अपना काम स्वयं कर सकता हूँ।
(1) मुझे (2) तुम (3) मैं (4) तू (5) मेरे (......)

20. प्रत्येक ............. के जीवन का मूलाधार पानी है।
(1) जीवीयो (2) जीवी (3) जीवियों (4) जीवीयों (5) जीवियो (......)

21. बहुत ............. ने इस दृश्य का नाना प्रकार से सजीव वर्णन किया है।
(1) कवि (2) कवी (3) कविओं (4) कवीयों (5) कवियों (......)

22. ............. के साथ भारतीय जनता के मन में एक नया आनंद भरता है।
(1) वर्ष (2) वर्षा (3) वर्षे (4) वर्षों (5) वर्षाएँ (......)

23 वसंत के आगमन से वृक्ष नये ............. का परिधान पहनकर शोभा युक्त हो जाते हैं।
(1) पत्तों (2) पत्ते (3) पत्ताओं (4) पत्ता (5) पत्तेओं (......)

24. ............. मन को अच्छे विचारों की आवश्यकता है उसी प्रकार आराम की भी।
(1) जहाँ (2) जब (3) जिस प्रकार (4) जो (5) जब-से (......)

25. यद्यपि भारत में बौद्धों की संख्या कम है ............. वहाँ के लोग उसका आदर करते हैं।
(1) जो (2) जैसे (3) और (4) जितना (5) तथापि (......)

26. ये सारे पूजा-पाठ हम मन ............. शांति के लिए करते हैं।
(1) से (2) का (3) की (4) के (5) पर (......)

27. गांधी जी ............. देखा है कि अंग्रेज़ भारतियों के साथ बड़ा दुर्व्यवहार करते थे।
(1) का (2) में (3) को (4) ने (5) से (......)

28. सन् 1983 में श्रीमती इंदिरा गांधी को ओलिंपिक स्वर्ण अलंकार ............. सम्मानित किया गया।
(1) का (2) से (3) को (4) में (5) ने (......)

29. नेहरू जी ने भारत ............. शक्तिशाली बनाने का हर संभव प्रयास किया।
(1) में (2) से (3) पर (4) को (5) की (......)

30. युवा होने ............. राजकुमार सिद्धार्थ का विवाह राजकुमारी यशोधरा से कर दिया गया।
(1) में (2) पर (3) ने (4) को (5) का (......)

31. गणतंत्र दिवस ............. राजधानी दिल्ली में भव्य समारोह का आयोजन किया जाता है।
(1) के अवसर पर (2) के द्वारा (3) के प्रति
(4) के सामने (5) के बजाय (......)

32. यह पद्य पंक्ति एक भजन ............. भी गायी जा सकती है।
(1) के भीतर (2) के नीचे (3) के कारण (4) के रूप में (5) के पास (......)

33. शिक्षा के प्रचार-प्रसार ............. पुस्तकालयों की तीव्र गति से स्थापना हुई थी।
(1) के बिना (2) के पास (3) के ऊपर (4) के साथ (5) के परे (......)

34. फूलों से ............. सुगंधित पवन मन को मुग्ध कर देता है।
(1) आनेवाली (2) आती हुई (3) आता हुआ (4) आती हुआ (5) आता हुई (......)

35. आज सुबह ............. समाचार-पत्रों में हमारी परीक्षा की सूचना भी दी गयी है।
(1) निकली (2) निकलता (3) निकलती (4) निकला (5) निकले (......)

36. **19, 38, 53** इन पूर्ण संख्याओं के हिंदी शब्द क्रमशः ............. हैं।
(1) उंतीस, अड़तीस, तिरपन (2) उन्नीस, अड़तीस, तिरपन
(3) उन्नीस, अड़तीस, तिरानवे (4) उंचास, अड़तीस, तिरपन
(5) उन्नीस, अड़तालीस, तिरपन (......)

37. $1\frac{1}{2}, 4\frac{3}{4}$ इन अपूर्ण संख्याओं के हिंदी शब्द क्रमशः ............. हैं।
(1) सवा, पौने पाँच (2) आधा, पौने पाँच (3) ढाई, पौने चार
(4) डेढ़, पौने पाँच (5) डेढ़, पौने चार (......)

38. **घड़ी का समय 3.15 है।** यह हिंदी शब्दों में ............. है।
(1) तीन सवा बजे (2) सवा पंद्रह बजे (3) तीन पंद्रह
(4) पंद्रह तीन बजे (5) सवा तीन बजे (......)

39. खुले आकाश में कहीं-कहीं धूमिल तारे ............. हैं।
(1) दिखाई देते (2) दिखाई देता (3) दिखाई देती (4) दिखाई देनी (5) दिखा देती (......)

40. ............. अपने घोंसलों से बाहर आकर चहचहाते हुए उड़ने लगीं।
(1) पक्षी (2) पक्षियों ने (3) चिड़ियों ने (4) चिड़ियाँ (5) चिड़िया (......)

41. **आनंद, चतुर, आग, भौंरा** इन शब्दों के पर्यायवाची शब्द क्रमशः ............. हैं।
(1) हर्ष, दक्ष, अनिल, भृंग (2) हर्ष, दक्ष, अनल, मृग
(3) हर्ष, दक्ष, अनल, भृंग (4) हर्ष, दक्षिण, अनल, भृंग
(5) नंद, दक्ष, अनल, भृंग (......)

42. **उतार, जन्म, सज्जन, अंदर, इन शब्दों के विलोम शब्द क्रमशः ............. हैं।**
(1) चढ़ाव, मृत्यु, दर्जन, बाहर (2) चढ़ाव, मृत्यु, दुर्जन, बहार
(3) चढ़ाव, मृतक, दुर्जन, बहार (4) चढ़ाव, मृत्यु, दुर्जन, बाहर
(5) अवतार, मृत्यु, दुर्जन, बाहर (......)

43. **बिना विचारे किया हुआ विश्वास।** इन अनेक शब्दों के स्थान पर योग्य एक शब्द ............. है।
(1) अविचार (2) अविश्वास (3) अंधविश्वास (4) अंधकार (5) विश्वास (......)

44. **आँखों का तारा होना।** इस मुहावरे का अर्थ ............. है।
(1) बहुत प्यारा होना (2) क्रोधित होना (3) तारा होना
(4) बहुत आँखें होना (5) आँख तारा होना (......)

45. **बदरीनारायण चौधरी 'प्रेमघन',** .......... युग के कवि हैं।
(1) छायावादोत्तर (2) प्रगतिवादी (3) भारतेंदु
(4) नव लेखन (5) छायावादी (......)

● **कोष्ठक में दिये गये निर्देश के अनुसार सही उत्तर चुनिए।**

46. प्रायः पिता जी अभी तक कार्यालय में काम ...........। ***(संदेहात्मक तात्कालिक वर्तमान काल)***
(1) कर रहा है (2) कर रहे हैं (3) कर रहा होगा
(4) करते रहे होंगे (5) कर रहे होंगे (......)

47. आगे भी तुम लोग इस प्रकार ........... तो कितना अच्छा है? ***(आभ्यासिक भविष्य काल)***
(1) पढ़ती रहोगे (2) पढ़ते रहोगे (3) पढ़ती रहेगा
(4) पढ़ता रहेगी (5) पढ़ता रहेगा (......)

48. नेता जी ने मतदान से पूर्व भी जनता की सेवा ...........। ***(पूर्ण भूत काल)***
(1) किया था (2) किये थे (3) किये थी (4) की थी (5) की थीं (......)

49. श्रीमती वर्मा जी अपने कपड़े धोबी से ........... हैं। ***(द्वितीय प्रेरणार्थक क्रिया)***
(1) धोती (2) धुलवाती (3) धुलाते (4) धुलवाते (5) धुलाता (......)

50. नौकर के द्वारा रोटियाँ ............. । ***(वर्तमान काल - कर्मवाच्य)***
(1) बनायी जाती हैं (2) बनायी जाती है (3) बन जाती है
(4) बनाती हैं (5) बनी गयी हैं (......)

* * *

# අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2018
## க.பொ.த (உயர் தர)ப் பரீட்சை - 2018

විෂයය අංකය } 84 විෂයය } හින්දි

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம் - I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 3 | 21. | 5 | 31. | 1 | 41. | 3 |
| 02. | 2 | 12. | 2 | 22. | 2 | 32. | 4 | 42. | 4 |
| 03. | 5 | 13. | 3 | 23. | 1 | 33. | 4 | 43. | 3 |
| 04. | 1 | 14. | 1 | 24. | 3 | 34. | 3 | 44. | 1 |
| 05. | 4 | 15. | 5 | 25. | 5 | 35. | 5 | 45. | 3 |
| 06. | 2 | 16. | 3 | 26. | 3 | 36. | 2 | 46. | 5 |
| 07. | 1 | 17. | 4 | 27. | 4 | 37. | 4 | 47. | 2 |
| 08. | 5 | 18. | 1 | 28. | 2 | 38. | 5 | 48. | 4 |
| 09. | 2 | 19. | 3 | 29. | 4 | 39. | 1 | 49. | 2 |
| 10. | 4 | 20. | 2 | 30. | 2 | 40 | 4 | 50 | 1 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට / ஒரு சரியான விடைக்கு ලකුණු (02) බැගින් 50 / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் 02 × 50 = 100

# හින්දි - II පත්‍රය

## I කොටස

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත ය. එහි ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 7කි. පළමුවන කොටසේ ප්‍රශ්න තුන ම අනිවාර්ය වේ. දෙවන හා තෙවන කොටස්වල ප්‍රශ්න දෙක බැගින් වේ. ඒ එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් තෝරා ගත යුතු ය. පිළිතුරු ලිවිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

01). මෙම ප්‍රශ්නය (ක) හා (ඛ) යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වේ. (ක) හින්දි ගද්‍ය ඡේදයක් සිංහලයට පරිවර්තනය කිරීම. I හා II වශයෙන් කොටස් දෙකකින් යුතු මෙම ප්‍රශ්නයේ එක් කොටසකට පමණක් පිළිතුරු අපේක්ෂා කෙරේ. (ලකුණු 15)

1. නිවැරදි අර්ථ පරිවර්තනය. ලකුණු 10

   (අඩුපාඩු සළකාබලා එයට සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.)

2. නිවැරදි ව්‍යාකරණය ලකුණු 03

3. භාෂා ශෛලිය. ලකුණු 02

**( क )** निम्नलिखित अवतरणों में से **किसी एक** का सिंहली/तमिल/अंग्रेज़ी में अनुवाद कीजिए।

(15 अंक)

i). अंग्रेज़ों के इस प्रकार के अन्याय के कारण भारत के लोगों में असंतोष फैल रहा था। देश को स्वतंत्र कराने के लिए कई स्थानों पर लड़ाइयाँ होने लगीं। रानी लक्ष्मीबाई भी बड़ी वीरता से लड़ीं। उन्होंने अपनी छोटी-सी सेना के साथ अपूर्व कुशलता से अंग्रेज़ों का सामना किया।

रानी की अंग्रेज़ों के साथ आखिरी लड़ाई ग्वालियर के किले के पास हुई। रानी ने घोड़े की लगाम को दाँतों से दबाया और दोनों हाथों से तलवार चलाती हुई वे अंग्रेज़ी सेना के भीतर घुस गयीं। उनकी तलवार बिजली की तरह चमक रही थी। वे जिधर जाते उधर मैदान साफ़ हो जाता था। अंग्रेज़ी सेना बहुत बड़ी थी। रानी के साथ थी वीरता और शक्ति।

පිළිතුර :

(i) ඉංග්‍රීසීන්ගේ මෙවැනි අසාධාරණකම් හේතුවෙන් භාරත වැසියන් අතර අසතුටක් පැතිරෙමින් තිබිණ. රට නිදහස් කරගැනීම සඳහා විවිධ ස්ථානවල යුද්ධ/ගැටුම්/අරගල/සටන් හටගන්නට/ඇතිවන්නට විය. ලක්ෂ්මිබායි රැජින ද/දේවිය ද අතිශය වීරත්වයෙන් යුද්ධ/සටන් කළාය/සටන් වැදුනාය. එතුමිය තම කුඩා සේනාවක් සමඟ අපූර්ව කෞශල්‍යයකින් යුතුව ඉංග්‍රීසීන්ට/ඉංග්‍රීසීන් හට මුහුණ දුන්නාය.

රැජිනගේ ඉංග්‍රීසීන් සමඟ වූ අවසන් ගැටුම ග්වාලියර් බලකොටුව අසල දී සිදුවිය. රැජින අශ්වයාගේ තෝන් ලනුව දත්වලින් තද කරගෙන/සපාගෙන සිය දෑතින් අසිපත ලෙලවමින් ඉංග්‍රීසි සේනාව අතරට වැදුනාය. එතුමියගේ අසිපත විදුලියක් මෙන් බැබලෙමින් තිබිණ. රණභූමිය තුළ පය තැබූ

සෑම තැනකම ජයග්‍රහණය ඈ සතු විය. ඉංග්‍රීසීන්ගේ සේනාව විශාල විය. රජින තුළ වීරත්වය සහ ශක්තිය විය. (ඉංග්‍රීසීන්ගේ සේනාව විශාල වූ අතර රජින තුළ වීරත්වය සහ ශක්තිය තිබිණ.)

(ii) रामचंद्र घर से बाहर निकला ही था कि उसे शेरू आता दिखाई दिया। "अवश्य ही यह सेठ जी के यहाँ से भाग आया है," यह सोचकर वह गुस्से-से भर गया। वह अंदर गया, एक लाठी लाया और ज्यों ही शेरू दौड़कर उसके पास आया, उसने उसे एक लाठी जमा दी। बेचारा कुत्ता वहीं गिर पड़ा। वह उसे दूसरी लाठी मारने ही वाला था कि शेरू की गले में बँधी चिट्ठी पर उसकी निगाह पड़ गयी।

चिट्ठी पढ़ते ही रामचंद्र सब कुछ समझ गया। उसने अपना सिर पीट लिया, "हाय! मैंने यह क्या किया?" यह कहते-कहते उसने शेरू को गोद में उठा लिया। सौभाग्य से शेरू मरा नहीं था। रामचंद्र ने शेरू की उचित चिकित्सा की और मन लगाकर उसकी सेवा करता रहा।

පිළිතුර :

(ii) රාමචන්ද්‍ර නිවසින් නික්මෙත්ම/නික්මයත්ම ඔහු ශේරු පැමිණෙනු දුටුවේය. අනිවාර්යයෙන්ම මූ නිවසින් / ගෙදරින් පැනවිත් ඇත/තිබේ. මෙසේ සිතූ ඔහු කේන්තියෙන් පිරීගියේය/පිපිරුවේය. ඔහු ඇතුළට ගොස් මුගුරක් ගත්තේය. ශේරු තමා වෙත දිව එත්ම ඔහු ඌට මුගුරෙන් පහර දුන්නේය. ඔහු ඌට ඊළඟ මුගුරු පහර දෙන්නට සැරසෙත්ම ශේරුගේ ගෙලේ බැඳි ලිපිය වෙත ඔහුගේ නෙත්/බැල්ම යොමු විය.

ලිපිය කියවත්ම රාමචන්ද්‍රට සියල්ල වැටහිණි. ඔහු (තම) හිසේ අත ගසා ගත්තේය. අපොයි/අනේ අපොයි! මම මේ මොකද කළේ/ අයියෝ ! මම මේ මොකද කළේ? මෙසේ කියමින් ඔහු ශේරුව තුරුළට ගත්තේය/ඇකයට ගත්තේය. වාසනාවකට ශේරු මිය ගොස් නොතිබිණ. රාමචන්ද්‍ර ශේරුට සුදුසු ප්‍රතිකාර කළ අතර ඉතා උනන්දුවෙන් ඌට සාත්තු සප්පායම් කළේය.

මෙයට ආසන්න පරිවර්තන සඳහා අදාළ ලකුණු ලබා දෙන්න.

(ख) निम्नलिखित अवतरण का हिंदी में अनुवाद कीजिए। (20 अंक)

අමල් ගෙයින් පිටත මිදුලේ සෙල්ලම් කරමින් සිටියේය. දවස තවම ගෙවී ගොස් නැත. ඉර බැස ගියේද නැත. වැසි සමයේ වළාකුළු අහසේ එහා මෙහා පාවෙමින් තිබුණි. සීතල සුළං ද හමා යමින් තිබුණි. මඳ වේලාවකින් තදින් වැස්ස වසින්නට පටන් ගත්තේය. අමල් ගෙයි කොරිඩෝවට පැමිණ වැස්ස දෙස බලා ඉන්නට විය. ලොකු ලොකු වැහි බින්දු පොළවට වැටී මිදුල වතුරෙන් පිරෙන්නට පටන් ගත්තේය. කුඩා කාලයේ අයියා සමඟ වැස්සේ කඩදාසි බෝට්ටුවලින් සෙල්ලම් කළ සැටි ඔහුගේ මතකයට නැගෙන්නට විය. ඒ මතකය සමඟින් සියුම් සතුටක් මෙන්ම දුකක්ද සිතට දැනෙන්නට විය.

පිළිතුර :

**(ख)** अमल घर से/के बाहर आँगन में खेल रहा था। दिन अभी नहीं भीत गया था। सूरज भी नहीं अस्त हुआ/डूब गया था। वर्षा के मौसम के बादल आसमान में इधर-उधर चल रहे थे। ठंडी हवा भी चल रही थी। थोड़ी देर बाद/कुछ समय के बाद घोर वर्षा होने लगी/भारी(तेज़ी) वर्षा होने लगी। अमल घर के बरामदे में आकर वर्षा की ओर देखने लगा। वर्षा की बड़ी-बड़ी बूँदें ज़मीन पर पड़कर आँगन पानी से भरने लगा। बचपन में भैया के साथ बरसात में कागज़ के नावों से खेलने का तरीका उसकी याद में आने लगा। उस याद के साथ हल्के से आनंद और दुख भी मन में आभास होने लगे/महसूस होने लगे।

1. නිවැරදි අර්ථ පරිවර්තනය. ලකුණු 10
2. ව්‍යාකරණය ලකුණු 05
3. භාෂා ශෛලිය. ලකුණු 05

(වාක්‍යයක ව්‍යාකරණ දෝෂ සඳහා ලකුණු භාගයක් ද අක්ෂර දෝෂ සඳහා ලකුණු භාගයක් ද අඩු කළ හැකි ය)

02). දී ඇති රචනා මාතෘකා අතුරින් එකක් තෝරාගෙන වචන 120කට නො අඩුවන සේ රචනාවක් හින්දි බසින් ලියන්න. ලකුණු 20

निम्नलिखित विषयों में से किसी एक विषय पर हिंदी में लगभग 120 शब्दों का निबंध लिखिए।

(i) ऐतिहासिक स्थान की यात्रा (ii) आदर्श छात्र

(iii) जल की उपयोगिता (iv) जेठ पूर्णिमा का दिन

1. මාතෘකාවට අදාළ බව ලකුණු 02
2. ප්‍රමාණාත්මක බව ලකුණු 01
3. නිවැරදි ව්‍යාකරණය ලකුණු 08
4. ආකෘතිය ලකුණු 03
5. සාරවත් බව ලකුණු 02
6. නිර්මාණශීලී බව. ලකුණු 04

03). මෙයින් භාෂා අවබෝධය පිළිබඳ නිපුණතාවය නිරීක්ෂණයට ලක් කෙරේ. ලකුණු 15

निम्नलिखित गद्यांश को ध्यान से पढ़िए और पूछे गये प्रश्नों के हिंदी में उत्तर दीजिए।

यूनान भारत की तरह ही एक बहुत प्राचीन देश है। जिस प्रकार भारत में अनेक विचारक और दार्शनिक पैदा हुए हैं, वैसे ही यूनान में भी। यूनान के ऐसे ही एक महान दार्शनिक थे - सुकरात। सुकरात के पिता एक साधारण राजगीर थे। अत: उनकी प्रारंभिक शिक्षा एक साधारण स्थिति के यूनानी के बच्चे की भाँति ही हुई। इसका परिणाम यह हुआ कि आगे चलकर भी उनके जीवन में सादगी बनी रही। गर्व और गुमान उन्हें छू तक नहीं गया था।

सुकरात यूनान और उसकी स्वतंत्रता को प्राणों से भी बढ़कर चाहते थे। वे स्वयं एक वीर योद्धा थे। यूनान की स्वतंत्रता की रक्षा के लिए उन्होंने कई युद्धों में भाग लिया। सुकरात को इस बात की भी चिंता थी कि उनके देशवासी बुद्धिमान, सत्यवादी, ईमानदार और दयालू बनें। अपने देशवासियों में इन गुणों को भरने के लिए वे अपना जीवन भी न्योछावर करने को तैयार थे। वे चाहते थे कि उनके देशवासी अधिक से अधिक ज्ञान प्राप्त करके न्याय और सत्य की रक्षा कर सकें।

(i) यूनान कैसा देश था? (02 अंक)
(ii) भारत के समान यूनान में कौन-कौन पैदा हुए थे? (02 अंक)
(iii) यूनान का दार्शनिक कौन था? (01 अंक)
(iv) सुकरात अपने देशवासियों से क्या चाहते थे? (02 अंक)
(v) सुकरात की प्रारंभिक शिक्षा कैसे हुई थी? (02 अंक)
(vi) 'सुकरात केवल दार्शनिक थे।' बताइए कि यह कथन सही या गलत है?(02 अंक)
(vii) ईमानदार, गर्व, इन शब्दों का वाक्यों में प्रयोग कीजिए। (04 अंक)

පිළිතුරු

(I) यूनान भारत की तरह ही एक बहुत प्राचीन देश था। ලකුණු 02
यूनान बहुत प्राचीन देश था। ලකුණු 02

(II) भारत के समान यूनान में अनेक विचारक और दार्शनिक पैदा हुए थे। ලකුණු 02
विचारक और दार्शनिक ලකුණු 01

(III)यूनान का दार्शनिक सुकरात था। ලකුණු 02
सुकरात था। ලකුණු 01
सुकरात ලකුණු 1/2

(IV) सुकरात अपने देशवासियों से चाहते थे कि वे अधिक से अधिक ज्ञान प्राप्त करके न्याय और सत्य की रक्षा कर सकें। ලකුණු 02

वे अधिक से अधिक ज्ञान प्राप्त करके न्याय और सत्य की रक्षा कर सकें। ලකුණු 01

(V) उनकी प्रारंभिक शिक्षा एक साधारण स्थिति के यूनानी के बच्चे की भाँति ही हुई थी। ලකුණු 02

एक साधारण स्थिति के यूनानी के बच्चे की भाँति ही हुई थी। ලකුණු 01

(vi) ग़लत है। ලකුණු 02

ग़लत ලකුණු 01

(vii) වාක්‍ය ලියා ඇති ආකාරය අනුව සුදුසු ලකුණු ලබා දෙන්න.

## II කොටස

04). නිර්මාණාත්මක ව භාෂාව භාවිත කිරීමේ නිපුණතාව මැනීම මෙයින් අපේක්ෂිත ය. ලකුණු 15

एक कौवा था। ..........उसे केक का टुकड़ा मिला। .......... वह पेड़ पर बैठकर खा रहा था। एक लोमड़ी उस पेड़ के नीचे आयी। .........कौवे के मुँह से केक का टुकड़ा गिर गया।

1. දී ඇති සැකිල්ලට අනුව කතාව නිර්මාණය කිරීම. ලකුණු $1\frac{1}{2}$
2. ප්‍රමාණාත්මක බව ලකුණු $1\frac{1}{2}$
3. සාරවත් බව ලකුණු 03
4. නිර්මාණශීලීත්වය. ලකුණු 03
5. ව්‍යාකරණය. ලකුණු 06

05). එදිනෙදා කාර්යයන් සඳහා භාෂා භාවිතය මෙයින් අපේක්ෂිත ය. ලකුණු 15

श्री लंका के मौसम का वर्णन करते हुए किसी भारतीय मित्र के नाम पर एक पत्र लिखिए।

1. ලිපියක ආකෘතිය ලකුණු 03
2. මාතෘකාවට අදාළ බව ලකුණු 03
3. භාෂා ශෛලිය ලකුණු 03
4. ව්‍යාකරණය. ලකුණු 06

## III කොටස

06). නූතන හින්දි සාහිත්‍ය පිළිබඳ අවබෝධය හා රසාස්වාදය මැනීම අපේක්ෂා කෙරේ. මෙහි සඳහන් කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. ලකුණු 15

ගද්‍ය කොටසේ එක කොටසකට ලකුණු 05 බැගින් මුළු ලකුණු 15කි.

कोष्ठक में दिये गये प्रश्नों के अनुसार निम्नलिखित अवतरणों का संदर्भ लिखिए।
*(किस रचयिता के किस पाठ से उद्धृत है? किसने; किससे; क्यों कहा है?)*

(i) "तुम्हारा हो जाता होगा। और होने को होता भी है; मगर वैसा बच्चा भी तो हो। पराये धन से भी कहीं घर भरता है?"

පිළිතුරු :

- रचयिता **विश्वम्भरनाथ शर्मा** है। ලකුණු 01
- यह गद्यांश **ताई** नामक कहानी से उद्धृत है। ලකුණු 01
- **रामेश्वरी** ने **रामजीदास** से कहा ලකුණු 01
- क्योंकि, रामेश्वरी बच्चे को अपनी गोद से ढकेलती है। तब दोनों में बहस होने लगता है। उसी समय रामेश्वरी रामजीदास से ऐसे कहती है। ලකුණු 02

(ii) "तुम नहीं मित्र, कोई भी व्यक्ति जिसके पास ह्दय है, ऐसे निर्दोष पक्षियों को कैसे मार सकेगा। लेकिन हाँ, तुम दौड़कर राजवैद्य से मरहम तो ले आओ।"

පිළිතුරු :

- रचयिता **विष्णुप्रभाकर** है। ලකුණු 01
- यह गद्यांश **न्याय** नामक एकांकी से उद्धृत है। ලකුණු 01
- **कुमार सिद्धार्थ** ने **सखा** से कहा। ලකුණු 01
- क्योंकि, सिद्धार्थ और सखा उद्यान में बातें कर रहे हैं। तब तीर लगा हुआ हँस उसके सामने गिर पड़ता है। उसी समय सिद्धार्थ सखा से ऐसे कहता है। ලකුණු 02

(iii) "भैया, कर्तव्य तो सदैव ही स्वीकार करना चाहिए और ऐसे नगर-निवासियों की सेवा करना हमारा कर्तव्य ही होना चाहिए।"

පිළිතුරු :

- रचयिता **रामकुमार वर्मा** है। ලකුණු 01
- यह गद्यांश **कल नहीं आज** नामक एकांकी से उद्धृत है। ලකුණු 01
- **भीम** ने **युधिष्ठिर** से कहा। ලකුණු 01
- क्योंकि, दोनों भाई राज्याधिकार पर बातें करते समय भीम ने ऐसे कहा। ලකුණු 02

එම ප්‍රශ්නයේ පද්‍ය කොටසට පිළිතුරු සපයන්නේ නම් පහත පරිදි ලකුණු ලැබේ. ලකුණු 15

निम्नलिखित पद्यांश का अर्थ सरल हिंदी में लिखिए।

उसका लंबा डील-डौल है,
हट्टी-कट्टी काठी चौड़ी;
इस खंडहर में बिजली-सी
उन्मत्त जवानी होगी दौड़ी।

भूखा है, पैसे पा, कुछ गुन-गुन,
खड़ा हो, जाता वह घर,
पिछले पैरों के बल उठ
जैसे कोई चल रहा जानवर

1. සංදර්භය
   - කතුවරයා ලකුණු 02
   - කවියේ නම ලිවීම. ලකුණු 02
2. කවියේ අර්ථය ලිහිල් බසින් ලිවීම. ලකුණු 07
3. ව්‍යාඛ්‍යාව සඳහා. ලකුණු 04

07). මෙය ප්‍රශ්න දෙකකින් සමන්විත වන අතර, එක් ප්‍රශ්නයක් තෝරාගත යුතු ය. ලකුණු 15

I. හින්දි සාහිත්‍ය ඉතිහාසයට අයත් නූතන යුගය පිළිබඳ දැනුම අපේක්ෂා කෙරේ.

प्रगतिवाद किसे कहते हैं? समझाइए। (15 अंक)

*(उत्तर सिंहली/अंग्रेज़ी/हिंदी में दिया जा सकता है)*

පළමුවන ප්‍රශ්නය සඳහා ලකුණු දීමේ පටිපාටිය.

1. යුගය අර්ථකතනය කිරීමට ලකුණු 10
2. යුගයේ ලේඛකයන් හා සාහිත්‍ය පිළිබඳව සඳහන් කිරීම. ලකුණු 05

II. දී ඇති සාහිත්‍යකරුවන් තිදෙනා අතුරින් දෙදෙනෙකුගේ සාහිත්‍ය සේවාව පිළිබඳ ව කෙටි හැඳින්වීමක් අපේක්ෂිත ය. එක් කොටසකට ලකුණු 7 1/2 බැගින් මුළු ලකුණු 15

ii. निम्नलिखित साहित्यकारों में से किन्हीं दो की साहित्यिक सेवाओं का संक्षिप्त परिचय दीजिए।

(i) जयशंकर प्रसाद (ii) सुमित्रानंदन पंत (iii) रामकुमार वर्मा

1. ලේඛකයාගේ පෞද්ගලික තොරතුරු ඉදිරිපත් කිරීම. ලකුණු 1 1/2
2. ලේඛකයා අයත් යුගය නම් කිරීම. ලකුණු 01
3. ලේඛකයාගේ සාහිත්‍ය නිර්මාණ හා සේවාව හඳුන්වා දීම. ලකුණු 05